
මතුගම අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2019


**13 ශ්‍රේණිය** **කාලය පැය 03**

චිත්‍ර කලාව - I කොටස

- I කොටස - සියලුම ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.
- ප්‍රශ්න අංක 01- 05 තෙක් ප්‍රශ්න වලට වඩාත් යෝග්‍ය පිළිතුර A ,B, C, D, E යන රූප සටහන්අතරින් තෝරන්න.


A


B


C


D


E

**01.'A' අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය, (.....)**

(01) පොළොන්නරුවේ ආලාහන පිරිවෙන් භූමියේ දක්නට ලැබෙන මූර්තියකි.
(02) පොළොන්නරුවේ ගල් විහාරයට අයත් පිළිමයකි.
(03) පොළොන්නරුවේ වටදාගෙය තුළ දක්නට ලැබෙන පිළිමයකි.
(04) පොළොන්නරුවේ ලංකාතිලකය අසල හමුවන පිළිමයකි.
(05) පොළොන්නරුවේ පබලු වෙහෙර අසල පිහිටි පිළිමයකි.

**02. 'B' අක්ෂරයෙන් දැක්වෙන ධම්මචක්ක මුද්‍රාවෙන් යුතු ගාන්ධාර දේශයෙන් හමු වූ පිළිමයක් වන මෙය, (.....)**

(01) කත්‍රා පිළිමයයි (02) පාරී බහුලොල් පිළිමයයි (03) බෙගම් පිළිමයයි

(04) තක්ති බහී පිළිමයයි (05)හෝට්මන්දාර් පිළිමයයි

**03. 'C' අක්ෂරයෙන් දැක්වෙන මූර්තියෙන් නිරූපනය වනුයේ,ලක්දිව ස්වයංපෝෂිත කළ උදාර නරපතියෙකි.ඒ,**

(01) ගැමුණු අභය රජතුමායි.
(02) නිශ්ශංකමල්ල රජතුමායි
(03) ධාතුසේන රජතුමායි.
(04) මහාපරාක්‍රමබාහු රජතුමායි.
(05) වළගම්බා රජතුමායි.


04. 'D' අක්ෂරයෙන් දැක්වෙන හින්දු ආගමික මූර්තිය, (.....)

(01) අප්පර්ස්වාමී නිරූපණය කරන චෝල මූර්තියයි.
(02) සුන්දර මූර්ති ස්වාමී නිරූපණය කරන මූර්තියයි.
(03) විශ්ණු දෙවියන් නිරූපණය කරන මූර්තියයි.
(04) වීනාධර නමින් හැඳින්වෙන චෝල මූර්තියයි.

05. ' E' අක්ෂරයෙන් දැක්වෙන යුරෝපා කලා ඉතිහාසයේ විශිෂ්ට නිර්මාණයක් වන මෙය, (.....)

(01) ග්‍රීක සම්භාව්‍ය යුගයේ නිමැවුමකි.
(02) ග්‍රීක හෙලනිස්ටික් යුගයේ නිමැවුමකි.
(03) ග්‍රීක මූර්ති ශිල්පී පිඩියස්ගේ නිර්මානයකි.
(04) රෝම ශිල්පීන් ග්‍රීක අනුකරනය කල අවස්ථාවකි.
(05) යුධ ජයග්‍රහණ සිහිවීම පිණිස කළ ග්‍රීක මූර්තියකි.

❖ ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් ප්‍රශ්න වලට වඩාත් යෝග්‍ය පිළිතුර පහත දැක්වෙන F, G, H, I, J ලෙස නම් කර ඇති රූප කොටස් ඇසුරින් තෝරන්න.



F G H I J

06.මෙහි දැක්වෙන රූ සටහන් අතුරින් චිත්‍ර කලා නිර්මාණ වනුයේ,

(01) F,G,H ය. (02) F,G,I ය. (03) G,H,I ය. (.....)
(04) J,F,G ය. (05) I, J, F ය

07. මෙම රූප සටහන් කොටස් අතරින් පැරණි ශිෂ්ටාචාර ආශ්‍රිත නිර්මාණ සිහිපත් කරනුයේ ,

( 01) F, H ය. (02) G, I ය. (03) H, J ය. (.....)

(04) I, F ය. (05) F, J ය.

08. බුදු සිරිතේ සිද්ධියක් සංකේත භාවිතයෙන් නිරූපණය කෙරෙන අවස්ථාවක් සිහිපත් කෙරෙන රූප කොටසක් වනුයේ,

(01) F (02) G (03) H (04) I (05) J ( ....)

09. පර්වත බිත්තියක සිතුවම් කරන ලද උසස් සිතුවම් කලාවක් ගැන සිහිපත් කරන සිතුවම් කැබැල්ල වනුයේ,

(01) F (02) G (03) H (04) I (05) J ( ....)

10. කිසියම් කතා පුවතක් ඇසුරෙන් පදනම් කරගෙන චිත්‍රණය වූ සිතුවම් පෙළක් සිහිපත් කරවන සිතුවම් කැබැල්ලක් වනුයේ,
(01) F (02) G (03) H (04) I (05) J ( ....)

❖ ප්‍රශ්න අංක 11 -15 තෙක් ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

11. මහනුවර යුගයේ විහාර සිතුවම් කලක් ආරක්ෂා වී පැවතිමට හේතු වනුයේ, (....)

(1) විහාර අභ්‍යන්තරයේ බිත්ති වල සිතුවම් කර ඇති නිසාය.
(2) දේශීය අමුද්‍රව්‍ය ඇසුරෙන් තැනූ වර්න ආලේප කොට ,වයිති ආලේප කල නිසාය.
(3) චිත්‍ර ඇදීමේදී වර්ණ දොරණ තෙලෙන් මිශ්‍ර කළ නිසාය.
(4) අල්ලිගාදූ ගා ඒ මත කරනය කොට වර්ණ පූර්ණය කර ඇති නිසාය.
(5) දූනු බදාමයෙන් කපරාරු කරන ලද බිත්ති මත චිත්‍ර ඇදි ඇති නිසාය.

12. සාම්ප්‍රදායික මෝස්තර නිර්මාණ වර්ගීකරණයට අනුව එක් වර්ගයකට අයත් මෝස්තර සමූහය කුමක්ද ? (....)

(1) ලියවැල , අරිම්බුව , නාග දැල්ල හා පලා පෙත්ත
(2) කතිර මල , කතුරු මල , වැටකේ මල හා පලා පෙත්ත
(3) හංස පූට්ටුව , සැරපෙන්දියා , ගජසිංහ හා නාරිලතා
(4) සීන මල , කඩුපුල් මල , වැටකේ මල හා ගල් බිංදුව
(5) තනිපට ලණුව , දෙපට ලණුව , හවසිය , කුකුළා හා මල

13.භාණ්ඩයක් සැලසුම් කිරීමේදී වඩාත් සැලකිළිමත් විය යුත්තේ, (.....)

(1) සිත් ගන්නා සුලු නිමාවකින් යුක්කත වීම.
(2) අඩු මිලකට අලෙවි කළ හැකි වීම.
(3) නිර්මාණයට හා පරිහරණයට පහසු වීම.
(4) පහසුවෙන් නිර්මාණය කළ හැකි වීම.
(5) චමත්කාරජනක වර්ණ මාලාවකින් යුක්ත වීම.


14.උද්‍යාන මූර්තියක් නිර්මාණයේදී වඩාත් සැළකිලිමත් විය යුත්තේ , (.....)

(1) ඉදිරි පහ පෙනුම පිළිබඳ වැඩි අවධානයක් යොමු කර හැඩතල මතු කර පෙන්වීමටයි.
(2) හැඩතල අවකාශයේ සමබරව විසිරී යන අයුරින් නිරූපනය කිරීමටයි.
(3) පරිමාණයෙන් විශාල නිර්මාණ කිරීමටයි.
(4) ඕනෑම දිශාවකින් බැලූ කළ චමත්කාරය දනවන අයුරින් හැඩතල සමබරව නිරූපණය කිරීමටයි.
(5) තාත්ත්වික හැඩ තල වලින් යුක්තව නිර්මාණය කිරීමටයි.

15. පිවිතුරු දියසායම් මාධ්‍යයක සුවිශේෂී ලක්ෂණයක් වනුයේ, (.....)

(1) වර්ණ පදාස වශයෙන් යෙදීමයි.
(2) සුදු වර්ණය සම්මිශ්‍රව යෙදීමයි.
(3) සංගත වර්ණ මතුවී පෙනෙන ලෙස යෙදීමයි.
(4) විනිවිද පෙනෙන අයුරින් වර්ණ භාවිතා කිරීමයි.
(5) දීප්තිමත් වර්ණ කැපී පෙනෙන අයුරින් යෙදීමයි.

❖ ප්‍රශ්න අංක **16 – 20** තෙක් අසා ඇති ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් **K,L,M,N,O** මඟින් දැක්වෙන මූර්ති ඇසුරෙන් තෝරන්න.



K L M N O

**16. K** ආකාරයෙන් දැක්වෙනුයේ , **(.....)**

**(1)** ඉන්දු නිම්න ශිෂ්ඨාචාරයේ ඇති මූර්තියකි.
**(2)** මොහෙන්ජදාරෝ වලින් පටු වූ මූර්ථතියකි .
**(3)** භාවනානුයෝගී ඉරියව්වෙන් යුතු ඉන්දු නිම්නයෙන් හමු වූ මූර්ථතියකි.
**(4)** සුදු හුණු ගලින් නිමවූ මූර්ථතියකි .
**(5)** රතු වැලි ගලින් නිරූපිත මූර්ථතියකි.

**17. L** ආකාරයෙන් දක්වා ඇත්තේ , **(.....)**

**(1)** පීසියස් නම් ශිල්පියාගේ මූර්ථතියකි.
**(2)** මයිරන් නම් ශිල්පියාගේ මූර්ථතියකි .
**(3)** ක්‍රීඩා කරන ඉරියව්වෙන් යුත් රුවකි .
**(4)** ඇන්ටිසොච් නම් ශිල්පියාගේ මූර්ථතියකි .
**(5)** කිරිගරුඩින් නිමවූ මූර්ථතියකි .

**18. M** අක්ෂරයෙන් දක්වා ඇත්තේ, **(.....)**

**(1)** අනුරාධපුර යුගයේ විශිෂ්ට ප්‍රතිමාවකි.
**(2)** පොළොන්නරු යුගායේ විශිෂ්ය ප්‍රතිමාවකි .
**(3)** මහනුවර හා අනුරාධපුර යුග දෙකම මිශ්‍ර කළ මූර්ථතියකි.
**(4)** අනුරාධපුර හා පොළොන්නරු යුග මිශ්‍රකළ මූර්ථතියකි .
**(5)** කලු ගලින් නිපද වූ අනුරාධපුර යුගයේ මූර්ථතියකි.


**19. N** අක්ෂරයෙන් දැක්වෙනුයේ , **(.....)**

**(1)** කිරිගරුඩ පාෂාණයෙන් නිමවූ ප්‍රතිමාවකි.
**(2)** සාරානාත් ගුරු කුලයට අයත් ප්‍රතිමාවකි.
**(3)** දම්සක් පැවතුම් මුද්‍රාවෙන් නිෂ්චිත වූ දුර්ලබ ප්‍රතිමාවකි.
**(4)** අමරාවති සම්ප්‍රදායට අයත් ප්‍රතිමාවකි.
**(5)** ගාන්ධාර සම්ප්‍රදායට අයත් ප්‍රතිමාවකි.

**20. O** අක්ෂරයෙන් අක්ෂරයෙන් දැක්වෙන උසස් මූර්තිමය ලක්ෂණ නිරූපිත ලෝකඩ මූර්තිය , **(.....)**


**(1)** ශිව දෙවියන්ගේ ප්‍රියතම නර්තන විලාශයක් පෙන්නුම් කැරන්නකි .
**(2)** ශිව දෙවියන් ගිනි වළල්ලක් මධ්‍යයේ නර්තනයේ යෙදෙන අවස්ථාවකි.
**(3)** හින්දු දහමේ සංකල්ප රැසක් සංකේතානු සාරයෙන් මූර්තිමත් තරන්නකි.
**(4)** ශිව දෙවියන්ගේ බලය හා ශක්තිය පෙන්වීමට කළ මූර්තියකි.
**(5)** වේගවත් චලන ඉරියව් දැක්යිවීමේ ලා ශිල්පියා සතුහැකියාව පිළිඹිබු කරන්නකි.


❖ ප්‍රශ්න අංක **21 - 25** තෙක් අසා ඇති ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර පහත සදහන් **P,Q,R,S,T** යනඇසුරෙන් තෝරන්න.


P


Q


R


S


T

**21. P** අක්ෂරයෙන් දැක්වෙනුයේ , **(.....)**

**(1)** ඉන්දියානු චිත්‍ර ශිල්පී අම්රිතා ගර්ගිල්ගේ සිතුවමකි .
**(2)** ඉන්දියානු චිත්‍ර ශිල්පී නන්දලාල් බෝස්ගේ සිතුවමකි .
**(3)** රවිද්‍රනාත් කාගෝර් විසින් ඇඳි සිතුවමකි .
**(4)** අධනින්ද්‍රනාත් කාගෝර් විසින් අඳිනු ලැබූ සිතුවමකි .
**(5)** සාවිත්‍රි රෝයි විසින් අඳනු ලැබූ සිතුවමකි .

**22. Q** ආකාරයෙන් දැක්වෙනුයේ, **(.....)**

**(1)** තිස්ස රණසිංහ විසින් ඇඳි සිතුවමකි .
**(2)** එච් .ඒ . කරුනාරත්න විසින් ඇඳි සිතුවමකි .
**(3)** සෝලියස් මැන්ඩිස් විසින් ඇඳි සිතුවමකි .
**(4)** එම්. සාර්ලිස් විසින් ඇඳි සිතුවමකි .
**(5)** ඩේවිඩ් පේන්ටර් විසින් ඇඳි සිතුවමකි .

**23. R** අක්ෂරයෙන් දැක්වෙන බිල්හානා හා චම්පාවති නම් වූ සිතුවම, **(.....)**

**(1)** වෙ ර පංචසිකයේ එන පුවතක් අනුව කළ කිර්මාණයකි.
**(2)** හින්දු සාහිත්‍ය පදනම් වූ කාව්‍ය ප්‍රකාශනයකි.
**(3)** රාජ්පුට් ශිල්පියාගේ සාම්ප්‍රදායික සංකේතාත්මක ප්‍රකාශනයකි .
**(4)** මිනිස් චරිත වෙනුවට මනුෂ්‍යාත්වය විග්‍රහ කිරීමට ගත් උත්සහයකි .
**(5)** ස්වාභාවිකත්වයෙන් ඇත් වූ ශෛලිගත ප්‍රකාශනයකි .

24. S අක්ෂරයෙන් දැක්වෙන සිතුවම , (.....)


(1) ගොගැන් විසින් අඳිනු ලැබූ විශිෂ්ට නිර්මාණයකි.
(2) මාර්ක් වාගල් විසින් අඳිනු ලැබූ විශිෂ්ට නිර්මාණයකි.
(3) ඩාලි විසින් අඳිනු ලැබූ විශිෂ්ට නිර්මාණයකි.
(4) වින්සන්ට් වැන්ගෝ විසින් අඳිනු ලැබූ විශිෂ්ට නිර්මාණයකි .
(5) පෝල් ක්ලී විසින් අඳිනු ලැබූ විශිෂ්ට නිර්මාණයකි .

25. T අක්ෂරයෙන් දක්වා ඇති සිතුවම , (.....)

(1) මහනුවර යුගයේ ගඩලාදෙනිය විහාරයේ බිතු සිතුවමකි.
(2) කරගම්පිටිය සුබෝධා විහාරයේ බිතු සිතුවමකි.
(3) මහනුවර දෙගල්දෝරුව විහාරයේ බිතු සිතුවමකි.
(4) බෙල්ලන්විල විහාරයේ බිතු සිතුවමකි.
(5) කතල්ව පූර්වාරාම විහාරයේ බිතු සිතුවමකි.

- ප්‍රශ්න අංක 26 – 80 තෙක් ප්‍රශ්න වලට ඉදිරියෙන් ඇති වාස්තු විද්‍යා නිර්මාණ නිර්මාණ ඇසරෙන් පිළිතුරු දෙන්න.

26.මෙහි දැක්වෙන ගොඩනැගිල්ල, (.....)




(1) මහනුවර යුගයට අයත් ටැම් ලිපියකි.
(2) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පනාපිටිය අම්බලමයි.
(3) මැදවෙල විහාර බිමේ ඇති ටැම්පිට විහාරයයි.
(4) ටැම්පිට ඉදිකරන ලද ධර්ම ශාලාවකි.
(5) මහනුවර දස්ත්‍රික්කයේ ඇම්බැක්ක දේවාලයයි.

27. මෙම වාස්තු විද්‍යා නිර්මාණය, (.....)




(1) අනුරාධපුරයේ ථූපාරාම වටදා ගෙයයි.
(2) මිහින්තලේ අම්බන්තල වටදාගෙයයි.
(3) මැදිරිගිරියේ වටදාගෙයයි.
(4) තිරියායේ වටදාගෙයයි.
(5) පොළොන්නරුවේ වටදාගෙයයි.

28. ඉදිරියේ දැක්වෙන හින්දු ආගමික දෙවොල , (.....)




(1) 1 වන රාජ රාජ රජු විසින් ධන්ජෝරයේ ඉදිකළ රාජ රාජේස්වර දෙවොලයි.
(2) රාජසිංහ රජු විසින් මහා මල්ලවපුරම් හී ඉදිකළ වැල්ලේ දෙවොලයි.
(3) නරසිම්හ වර්වන් විසින් මහා මල්ලවපුරම් හී ඉදිකරන ලද පංච පාණ්ඩව රථ අතුරින් එකකි.
(4) රාජේන්ද්‍ර චෝල ඉදිකල කුම්භකෝණම් දෙවොලයි.
(5) දකුණු ඉන්දියාවේ දක්නට ලැබෙන එකම හින්දු ආගමික දෙවොලයි.

**29.** ඉදිරියේ දැක්වෙන සුවිසල් දේවස්ථානය, (.....)



**(1)** දෙවන රමෙසස් රජුගේ දේවස්ථානය ලෙස නයිල් ගං ඉවුරේ ඉදි කල අබුසම්බල් දෙවොලවයි.
**(2)** අස්වාන් වේල්ල නිසා ජලයෙන් යටවී ගිය අබුසිම්බල් දෙවොලයි.
**(3)** රමේසස් ඇතුලු පාරාවරුන් 4 දෙනෙකු වෙනුවෙන්ඉදි තළ අබුසිම්බල් දෙවොලයි.
**(4)** මිසරයේ පර්වත හාරා ඉදිකරන ලද එකම දේවස්ථානය වන අබුසිම්බල් දෙවොලයි.
**(5)** ආමන් රා වෙනුවෙන් ඉදිකල අබුසිම්බල් දෙවොලයි.

**30.** ඉදිරියේ දැක්වෙනුයේ, (.....)



**(1)** ඔලිම්පියා හී හේරා දෙවොලයි.
**(2)** ඇතැන්ස් හි ප්‍රොපීලියා දෙවොලයි.
**(3)** ඇතැන්ස් හි පාර්තිනන් දෙවොලයි.
**(4)** ඇතැන්ස් හි ඇක්රොපොලිස් දෙවොලයි.
**(5)** ඇතැන්ස් හි ඔලිම්පියන් සීයුස් දෙවොලයි.

❖ ප්‍රශ්න අංක 31 – 35 තෙක් ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

**31.** මහියංගන ධාතු ගර්භයේ චිත්‍ර , (.....)

**(1)** පොළොන්නරු යුගයේ මුල් භාගයට අයත්ය.
**(2)** පොළොන්නරු යුගයේ අවසාන භාගයට අයත්ය.
**(3)** අනුරාධපුර හා පොළොන්නරු යුග දෙකට අයත්ය.
**(4)** අනුරාධපුර යුගයේ මුල් භාගයට අයත්ය.
**(5)** පොළොන්නරු යුගයෙන් පසු යුගයකට අයත්ය.

**32.** නුවර යුගයේ පහතරට සිතුවම් කලාවේ විශේෂ ලක්ෂණයක් වනුයේ , (.....)

**(1)** තීරු අතර පරතරය පුලුල් වීම අඛණ්ඩ කථන ක්‍රමය නොසකා හැරීම.
**(2)** කථා පුවතේ අවස්ථා රූප රාමු ලෙස වෙන්කර දැක්වීමය.
**(3)** යුරෝපීය පාරිභාරික භාණ්ඩ හා ඇඳුම් පැළඳුම් චිත්‍ර වලින් නිරූපනය වීමය.
**(4)** ශෛලිගත බවට වඩා ස්වාභාවිකත්වයට බර වීමය.
**(5)** ජාතක කතා වලට වඩා චරිත කතා වලට බර වීම.

**33.** මෙය කලාවට අශෝක ස්ථම්භ වැඩි ප්‍රමාණයක් නිර්මාණය කර ඇත්තේ , (.....)

**(1)** බුද්ධ චරිත හා සම්බන්ධ සිදුවීම් හා ස්ථාන සිහි වීමටය .
**(2)** අශෝක රජුගේ කීර්ති නාමය රටට හෙළි කිරීමටය.
**(3)** අශෝක රජු බුදු දහම වැළඳ ගැනීම සංකේතවත් කිරීමටය.
**(4)** අශෝක රජුගේ ධර්ම ප්‍රචාරණක කටයුතුසිහි වීමටය.
**(5)** අශෝක රජු ලද යුද ජයග්‍රහන සිහි වීමටය.


**34.** ඉන්දු නිම්නයෙනක් හමුවූ පූජක රූව මූර්තියෙන් , (.....)

(1) ඉන්දු නිම්න ශිෂ්ඨාචාරය තුල පූජක වරුන් සිටි බවට තොරතුරු සපයයි.
(2) ද්‍රවිඩ සම්බවයක් තිබූ මිනිසුන් ජීවත් වූ බවට සාධක සපයයි.
(3) මොන්ගෝලියානු වැසියන් මෙකල විසූ බවට ඉගියක් පවසයි.
(4) ඉන්දිය ගෝත්‍රික පුද්ගල ආකෘතියක් සිහි ගන්වයි.
(5) භාවනානුයෝගී පූජකවරයකුගේ භාවාත්මක ගුණ ප්‍රකාශ කරයි.

**35.** ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගුහා සිතුවම් හි මානව සත්ත්ව රූ, (.....)

(1) ක්‍රියාකාරිත්වය දක්වමින් ස්වාභාවිකව ඇදීමට උත්සාහ දරාඇත.
(2) සංකේතාත්මකව සරල ලෙස ඇඳ ඇත.
(3) ජීව ප්‍රමානයට වඩා විශාලව ඇඳ ඇත.
(4) සංනිවේදන ක්‍රියාවලියට උචිත සේ ඇඳ ඇත.
(5) බලංගොඩ මානවයාගේ ජන ජීවිතය නිරූපණයට යොදා ගෙන ඇත.

❖ ප්‍රශ්න අංක 35 - 40 තෙක් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරන්න.



**36.** මෙම සිතුවම ඇත්තේ, (.....)

(01) කැළණි විහාරයේ පැරණි විහාරයේ ය.
(02) බෙල්ලන්විල නව විහාරයේය.
(03) මාළිගාවත්ත පිරිවෙන් විහාර මන්දිරයේ ය.
(04) සේදවත්ත වෙහෙරගොඩැල්ල විහාරයේය.
(05) කරගම්පිටිය විහාරයේ ය.

**37.** මෙම සිතුවම , (.....)

(01) සෝලියස් මැන්දිස්ගේ ය.
(02) සෝමබන්ධු විද්‍යාපතිගේ ය.
(03) ඇම්.සාලිස් සිත්තරාගේ ය.
(04) ඇල්බට් ධර්මසිරිගේ ය.
(05) මංජු ශ්‍රී ගේ ය.

38.මෙමෙ සිතුවමේ වර්ණ භාවිතයේදී , (.....)

(01) දීප්තිමත් වර්ණ භාවිතයෙන් වැළකී අඳුරු වර්ණ භාවිත කර ඇත.
(02) පියකරු දීප්තිමත් වර්ණ මාලාවක් භාවිත් කර ඇත.
(03) මනා සංයමයෙන් යුතුව සංගත වර්ණ භාවිතා කර ඇත.
(04) වර්ණ වල මධුර්ය ගුණය රැකගැනීමට උත්සාහ දරා ඇත.
(05) උෂ්ණ වර්ණ වල ප්‍රභේද මනා සංයමයෙන් භාවිතා කර ඇත.

39.මෙම සිතුවමේ ප්‍රකාශනයේ හා සම්බන්ධයේ විශේෂත්වයක් ලෙස, (.....)

(01)මානව රූපවල ඇඳුම් පැළඳුම් සඳහා නර්තන හා නාට්‍ය කලාවේ යම් අභ්‍යාසයක් ලබා ඇති බවපෙනේ.
(02) මෙම සිතුවමින් මතුවන චමත්කාරය ජනකලාවන්ගේ හා සම්භාව්‍ය චිත්‍ර කලාවේ එකතුවක් පේපෙනේ.
(03) මානව හැඩතල තුළ අධ්‍යාත්මික බවක් හා ප්‍රාසාංගික බවක් දැකිය හැකි වීම.
(04) බෞද්ධ චිත්‍ර කලාවට නව අරුතක් එක් කරමින් භාවාත්මක ප්‍රකාශිත වස්තූන් නවතාවකින් යුතුව ඉදිරිපත්කර ඇති බව පෙනේ.
(05) සීගිරි සිතුවමින් රටට හඳුන්වා දුන් රේඛාවේ ලාලිත්‍ය නැවත විහාර බිතු සිතුවම් වලට එක් ව අවස්ථාවන් දක්නට ලැබේ.

40. මෙම නිර්මාණය විශිෂ්ට නිර්මානයක් ලෙස පිළිගැනෙනුයේ, (.....)

(01) බොදු සංකල්ප භාවාත්මකව ,මනාසංයමයෙන්යුතුව නවතම චිත්‍ර කලා ශෛලියෙන් යුතුව නිර්මාණය කර ඇති බැවිනි.
(02)මානව රුව හා අනෙකුත් හැඩතල තුළින් නරඹන්නන්ගේ සිත් ඇද ගැන්මට සමත් වන බැවිනි.
(03) සාම්ප්‍රදායික සිතුවම්රටාවෙන් මිදී ඇති බැවිනි.
(04) ස්වාභාවික හැඩතල නවතම ශෛලියකින් ඉදිරිපත් කර ඇති බැවිනි.
(05) අජන්තා,සීගිරි වැනි ශිල්පීන්ගේ ශෛලියට අනුකූලව සංරචනය වී ඇත් බැවිනි.

## චිත්‍ර කලාව - II කොටස

❖ එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින් ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.

### "අ"කොටස
### (චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ශ්‍රී ලංකාව)

01.අනුරපුර යුගයෙන් පසු මහනුවර යුගය වනවිට සිතුවම් කලාව තුළ මහත් වෙනසක් සිදු විය.

i. අනුරපුර යුගයේ බෞද්ධ සිතුවම් හමුවන ස්ථාන 4 ක් නම් කරන්න.
ii. මහනුවර බිතුසිතුවම් කලාවේ දැකිය හැකි ලක්ෂන 3ක් හා අනුරපුර යුගයේ සිතුවම්හි දැකිය හැකි ලක්ෂණ 3ක් දක්වන්න.
iii. මහනුවර යුගයේ පහතරට සිතුවම්සම්ප්‍රදාය ,උඩරට සම්ප්‍රදායෙන් වෙනස් වන අයුරු පහදන්න.

02.පොළොන්නරුවේ පැවති හින්දුපාලන සමයේදී ඉදි වූ දේවාල තුළින් හින්දුදේව මූර්ති රැසක් හමුව ඇත.

i. නටරාජා මූර්තියේ ප්‍රකාශිත සංකේත 04 ක් නම් කරන්න.
ii. පාර්වති මූර්තිය ගැන කෙටි ඇගයීමක්කරන්න.
iii. හින්දු ආගමික මූර්ති කලාව කෙරෙහි බලපා ඇති පොදු ලක්ෂණ හා ශිල්ප ක්‍රම පහදන්න.

"ආ" කොටස

(චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය - ඉන්දියාව )

03.16 වන සියවස සිට 18 වන සියවස පමණ වන විට ,උත්තර භාරතයේ ව්‍යාප්තව පැවති මෝගල් හා රාජ්පුත් සමකාලීන චිත්‍ර කලා සම්ප්‍රදායන් 02 කි.

i. මෝගල්චිත්‍ර කලාවේ විශේෂ ලක්ෂණ 02 ක් ලියන්න.
ii. රාගමාලා චිත්‍ර යනු කුමක්දැයි කෙටියෙන් පහදන්න.
iii. රාජ්පුත් චිත්‍ර කලාව ,මෝගල් චිත්‍ර කලාවෙන් වෙනස් වන්නේකෙසේද,පහදන්න.

04. ක්‍රි.ව.1 සිට ක්‍රි.ව.5 දක්වා බෞද්ධ කලා මධ්‍යස්ථානයක් ව පැවති ගාන්ධාරය ,භාරතයේ බෞද්ධ කලා ඉතිහාසයේ සන්ධිස්ථානයකි.

i. ගාන්ධාර ශිල්පින් නිම වූ බුදු පිළිම 02 ක් නම් කරන්න.
ii. ගාන්ධාර කලාවේ ස්වභාවය කෙටියෙන් පහදන්න.
iii. ගාන්ධාර සම්ප්‍රදායට සමකාලීන වූ මථුරා සම්ප්‍රදායට අනුව නිම වූ බුදු පිළිම වල අධ්‍යාත්මික ගුණය ඉහළය.පහදන්න.

"ඉ" කොටස

( චිත්‍රකලාවේ ඇගයීම හා රසාස්වාදය - යුරෝපය )

05.රෝමන්වරු තමන්ගේ කලාවන් පෝෂණය කර ගැනීමේදී ග්‍රීකයන් වෙතින් ලද ආභාෂය අතිමහත්ය.

i. ගොඩනැගිලි නිර්මාණයේදි රෝමන්වරු ග්‍රීකයන්ගෙන් ලද කුළුණු 02 ක් නම්කරන්න.
ii. 'ප්ලේවියන් ඇම්පතියවර්' රංග පියය පිළිබදව කෙටියෙන් පහදන්න.
iii. රෝමන්වරුනිම වූ මූර්ති 03 ක් පිළිබදව අගයන්න.

06.යුරෝපයේ පුනර්ජීවන යුගයෙන් පසුව විශාල යුග පෙරළියක් බවට පත් විය.

i. පශ්චාත් උපස්ථිතිවාදයට අයත් ශිල්පින් දෙදෙනෙකු නම්කරන්න.
ii. පුනර්ජීවන යුගයට අයත් ශිල්පින් තිදෙනෙකු දක්වන්න.
iii. ඉර උදාව නම් සිතුවම පිළිබදව අගයන්න.

චිත්‍ර කලාව - III කොටස - කාලය පැය 03 කි .

❖ පහත 'අ' 'ආ' 'ඉ' කොටස් වලින් එක් මාතෘකාවක් පමණක් තෝරා ගන්න.

'අ' කොටස -චිත්‍ර සංරචනය

1. නාන තොටක දිය නාන යුවතියෝ
2. අර්ද නාගරික ජනාකිර්න මාවතක්
3. මාළු වෙළඳපලක් / ඉරිදා පොළ

'ආ' කොටස - මෝස්තර නිර්මාණය

1. ව්‍යුක්තරූපි සත්ව හැඩතලයක් ඇසුරින් සරම් වාටියක් නිර්මාණය කරන්න.
2. පාරම්පරික උද්භිද මෝස්තර ඇසුළුරින් දොර රෙද්දකට උචිත මෝස්තර නිර්මානයක් කරන්න.
3. අඩි 3×5 ප්‍රමානයේ මේස රෙද්දක් සැරසිමට මදය ලක්ෂය කේන්ද්‍ර කොටගෙන විහිදී යන මුලු කල මෝස්තරයක් නිර්මානය කරන්න

'ඉ'කොටස

1. රූපලාවනයාගාරයක ප්‍රචාරණයට අ.4×6 ප්‍රමානයේ ප්‍රචාරක ප්‍රදර්ශන පුවරුවක් අක්ෂර සහිතව විචිත්‍රවත්ව නිර්මාණය කරන්න.
2. යොවුන් නවකතාවකට සුදුසු පිට කවරයක් නිර්මාණය කරන්න.
3. මෝස්තර නිර්මානය (Fashion Disignin) යටතේ සගරාවක් සඳහා සුදුසු දැන්වීමක් නිර්මානය කරන්න.